# නිවේදනය **B**

**2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා ගරු මුදල් අමාත්‍යතුමා විසින් 2023 වර්ෂය සඳහා අයවැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන කලින් වසරවලදී සිදු කළ ආකාරයටම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.**

- **2022 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බව දන්වනු කැමැත්තෙමි:—**

  **මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ම, මෙදින ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.**

- **2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බව ද දන්වනු කැමැත්තෙමි:—**

  (අ) මහජන ගැලරිය රාජ්‍යතාන්ත්‍රික අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ.

  (ආ) පාර්ලිමේන්තු රථගාල මෙදින වසා තබන බැවින්, මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථගාල් වෙත යොමු කරනු ලැබේ.

  (ඇ) මෙදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී, හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

  (ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ම, තම රථය පදවාගෙන එන්නේ නම්, එම මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාල වෙත ධාවනය කර ගාල් කරවීම පිණිස මන්ත්‍රී පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් එම සේවාවේ යොදවනු ලැබේ.

  (ඉ) මෙදින රථ වාහන පොලීසිය සහ සමීප පොලිස් ස්ථාන මඟින් විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

**ඉහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වනු කැමැත්තෙමි.**